**බුද්ධිමය දේපළ අරමුදල - 2017**

**---------------------------------**

බුද්ධිමය දේපළ අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 176 (6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 05 දින ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බුද්ධිමය දේපළ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතයවේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01හි 109 ඡේදය ප්‍රකාරව වියදම් වර්ගීකරණය කර දැක්වීමකින් තොරව සියලුම වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුල ඇතුළත් කර තිබුණු අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල අයිතම ඉහත ප්‍රමිතය ප්‍රකාරව පෙළගස්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව අරමුදලේ වත්කම් ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවත් ඵලදායී ජීව කාලයක් හෝ පැවැත්මක් නොමැති, ඉදිකිරීම් සිදු කෙරෙන අතරමගදී ඉදිකිරීම් නවතා දැමීමට සිදුව තිබූ බුද්ධිමය දේපළ ප්‍රවර්ධන මධ්‍යස්ථානය සඳහා ඒ දක්වා වැය කර තිබුණු රු.22,298,751 ක මුදල ප්‍රාග්ධනිත කර 2013 වර්ෂයේ සිට වාර්ෂිකව රු.1,114,937 ක් බැගින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 4,459,750 ක් ක්ෂය වෙන් කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර බිල්පත් දෙකකට අදාලව සහ භාණ්ඩාගාර බැදුම්කරයකට අදාලව සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම හා ලැබිය යුතු පොලී ආදායම පිළිවෙලින් රු.806,738 ක් සහ රු.10,639 අඩුවෙන් සහ වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව එකතුව රු.320,804 ක් වූ ගෙවිය යුතු විදුලි හා ජලගාස්තු ගිණුම් ගත කර නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 175 වන වගන්තියට යටත්ව, 2006 අංක 01 දරන බුද්ධිමය දේපළ නියෝග 58 ( 2 ) වගන්තිය ප්‍රකාරව අනුයෝජිතයින් බඳවා ගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා වූ විභාගයක් තමන් විසින්ම හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහායෙන් හෝ පැවැත්වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට මෙම වගන්තිය හා නියෝග ප්‍රකාරව හැකි වුවද එවැනි විභාගයක් පවත්වා අනුයෝජිතයින් පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වන අය පමණක් අනුයෝජිතයින් ලෙස මේ දක්වා පත් කර ගෙන තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.75,794,322 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.60,154,755 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.15,639,567 කින් වර්ධනය වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආයෝජන පොලී ආදායම රු.15,232,565 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන ලෙස හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.49,692,263ක් වූ අතිරික්තය උච්චාවචනයන් සහිතව සමාලෝචිත වර්ෂය වන විට රු.75,794,322ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවත් සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.53,998,456 ක්වූ දායකත්වය සමාලෝචිත වර්ෂය වන විට රු.83,923,137 දක්වා වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, කාර්මික සැලසුම් ඇතුළු බුද්ධිමය දේපළ පරිපාලනය කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යයක් වන අතර විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එහි කාර්යසාධනය පහත පරිදි විය.

**(අ) වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම**

(i) සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද වෙළඳ ලකුණු සංඛ්‍යාව 10,622 ක් වූ අතර ඒවා 1979 සිට 2016 දක්වා ලද අයදුම්පත් විය.විගණනයට භාජනය කරන ලද නියැදිය අනුව ගොනු 20කට අදාලව වෙළඳ ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත ලද දිනයේ සිට එය පරීක්ෂා කිරීම සඳහා මාස 07 සිට වසර 10 දක්වා කාලයක්ද, ගැසට් පත්‍රයේ පළ කිරීමේ ගාස්තු

ගෙවීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා වසර 01 සිට වසර 03 දක්වා කාලයක්ද, ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවූ දින සිට ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම සඳහා මාස 06 සිට වසර 05 ක් දක්වා කාලයක්ද වශයෙන් සැලකිය යුතු ප්‍රමාදයන් සිදු වී තිබුණි. නිලධාරීන් ප්‍රමාණවත් නොවීම, අයදුම්කරුවන් විසින් ප්‍රතිවාර දැක්වීමේ ප්‍රමාදයන්, අභියාචනා සලකා බැලීම සහ සාකච්ඡා වාර සඳහා කාලය ගත වීම යනාදිය මෙම ප්‍රමාදයන් සඳහා හේතුවී තිබුණි. වර්ෂය තුල ලියාපදිංචි කළ වෙළඳ ලකුණු තුල 2007 දක්වා ලද අයදුම්පත් 2,899 ක් වූ අතර ඒවා ලියාපදිංචි කරන අවස්ථාව වන විටත් එහි වසර 10 ක වලංගු කාලයද අවසන් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචි කිරීම සඳහා පරීක්ෂා කරමින් පැවති ගොනු 32,716 ක් ද, වැඩ ආරම්භ කර නොතිබුණු ගොනු 1,968ක් ද වූ අතර ඊට අමතරව අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර දැක්වීම්, විරෝධතා ලැබීම්, සාකච්ඡා වාර පැවැත්වීම්, උසාවි නියෝග ලැබීම් හා ගැසට් කිරීමට ඇති යනාදී කරුණු මත ලියාපදිංචියට අදාල ඉදිරි කටයුතු කිරීමට නියමිත ගොනු 35,971 ක්ද පැවතුණි.

(iii) 2017 වර්ෂය තුල ලද 11,281 ක් වූ අයදුම්පත්වලින් කිසිදු අයදුම්පතක් විගණන දිනය වූ 2018 අප්‍රේල් වන විටත් ලියාපදිංචි කිරීමට නොහැකි වී තිබූ අතර පසුගිය වර්ෂයේ ලැබී තිබූ 10,825 ක් වූ අයදුම්පත් වලින් විගණන අවස්ථාව වූ 2018 අප්‍රේල් වන විටත් ලියාපදිංචි කර තිබුණේ ගොනු 51 ක් පමණි. පසුගිය වර්ෂවල සිට ඉදිරියට ගෙන එන ලියාපදිංචි ක්‍රියාවලියේ විවිධ අදියරයන්හි පවතින ගොනුවල කටයුතුද සිදු කිරීම මේ සඳහා හේතු වී තිබුණි.

(iv) බුද්ධිමය දේපළ පනතේ 119 (3) ප්‍රකාරව වෙළඳ ලකුණක වලංගු කාලය ඉකුත් වී මාස 06 ක් ඇතුලත අධිගාස්තුවක් ගෙවීම මත අළුත් කළ හැකි වුවත් වලංගු කාලය ඉක්ම වූ පසු ලියාපදිංචි සහතික නිකුත් කළ වෙළඳ ලකුණු සඳහා අළුත් කිරීම් සිදු කිරීමට සහතිකය අත්සන් කළ දින සිට වර්ෂයක කාලයක් ලබා දී තිබුණි. ලියාපදිංචි ක්‍රියාවලියේ විවිධ අදියරයන්හි සිදුවී තිබූ ප්‍රමාදයන් මේ සඳහා හේතු වී තිබුණි.

(v) ජාත්‍යන්තරව වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ සන්ධාන පත්‍රයට ප්‍රවේශවීම සඳහා වූ පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ කටයුතු 2017 වර්ෂය අවසන් වන විට අවසන් විය යුතු වුවත් විගණන දිනය වූ 2018 ජුනි වන විටත් ඊට අදාල කටයුතු අවසන් කර නොතිබුණි. මේ සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් නව සර්වර් යන්ත්‍රයක් මිලදී ගෙන ස්ථාපිත කිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට 2016 දෙසැම්බර් 30 දින තොරතුරු හා තාක්ෂණ ආයතනය සමග එළඹ රු.මිලියන.32.50 ක් ගෙවා තිබුණි. අදාල ගිවිසුම්ගත කාලයද 2017 දෙසැම්බර් 31 දින වන විට අවසන් වී තිබූ අතර අදාල යන්ත්‍රය විගණන අවස්ථාව වූ 2018 ජූලි මාසය වන විටද ලැබී නොතිබුණි.

**(ආ) නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම**

-----------------------------------------------------------------

(i) සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කරන ලද පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව 181 ක් වූ අතර ඒවා 2005 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලද අයදුම්පත් විය. ඒ අනුව පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම සඳහා මාස 05 සිට අවුරුදු 12 දක්වා කාලයක් ගත වී තිබුණි. නියැදි විගණනයට භාජනය කරන ලද ගොනු 10කට අදාලව පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ පසු එය පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම්පත් ලද දින සිට මාස 08 සිට වසර 10 දක්වා කාලයක් ගතවී තිබුණි. 2017 වර්ෂය තුල ලද අයදුම්පත් 542 න් ලියාපදිංචි කළ හැකිව තිබුණේ 04ක් පමණි.

(ii) පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කර දෙවන අවුරුද්ද ඉකුත් වූ විට එය බලාත්මකව තබා ගැනීමට පේටන්ට් බලපත්‍රලාභියා අදහස් කරන්නේ නම් පනතේ 83(2) වගන්තිය ප්‍රකාරව, පේටන්ට්

බලපත්‍රය වාර්ෂිකව අදාල ගාස්තු ගෙවා අලුත් කර ගත යුතු විය. එහෙත් 1997 වර්ෂයේ සිට 2015 වර්ෂය අවසාන වන විට පේටන්ට් බලපත්‍ර 3795 ක් ලබා දී තිබුණද 2017 වර්ෂයේදී අළුත් කිරීම් සිදු කර තිබුණේ ඉන් 525 ක පමණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචි ක්‍රියාවලියේ විවිධ අදියරයන්හි ගොනු 2582 ක් පැවති බව නිරීක්ෂණය විය. එයින් දෝෂ දන්වා යවන ලද ගොනු 1106 ක් පැවති නමුත් ප්‍රතිචාර දැක්වීමේ කාලය ඉකුත් වූ ගොනු සම්බන්ධයෙන් පනතේ 78(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එදින වන විට වැඩ ආරම්භ කර නොමැති ලිපිගොනු සංඛ්‍යාව 51 වූ අතර එම ගොනු අතර 2017 2016, 2014, 2013 හා 2012 වර්ෂවල පිළිවෙලින් ලද අයදුම්පත් 08 ක්, 03 ක්, 17 ක්, 08 ක් හා 09 ක්ද 2009, 2010 හා 2011 වර්ෂවල ලද අයදුම්පත් 06 ක් ද විය.

**(ඇ) කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම**

(i) සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද කාර්මික සැලසුම් අයදුම්පත් සංඛ්‍යාව 330 ක් වූ අතර ඒවා 2008 හා 2013 වර්ෂයද සහ 2015 සිට 2017 දක්වා කාලය තුළ ලැබුණු අයදුම්පත් විය. ඒ තුල 2008 දී ලද අයදුම් පත් 08ක් වූ අතර අයදුම්කරුවන් විසින් ගැසට් කිරීමේ ගාස්තු ගෙවීම ප්‍රමාද වීම මත එම ප්‍රමාදය සිදුවී තිබුණි. 2017 වර්ෂය තුල ලද 336ක්වූ අයදුම්පත්වලින් වර්ෂය තුල ලියාපදිංචි කර තිබුණේ 83ක් පමණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචි ක්‍රියාවලියේ විවිධ අදියරයන්හි ගොනු 379 ක් පැවති බව නිරීක්ෂණය විය.

**4.1.2 තාක්ෂණික හා නවෝත්පාදන මධ්‍යස්ථාන ආරම්භ කිරීම**

තාක්ෂණික තොරතුරු ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට අවස්ථාව ලබාදීම හා තාක්ෂණික තොරතුරු සඳහා මහජනතාවට අවශ්‍ය ප්‍රවේශය සලසාදීම මගින් නවෝත්පාදන දිරිගැන්වීම හා බුද්ධිමය දේපළ පිළිබඳව මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා දිවයිනේ පළාත් 09 ම ආවරණය වන පරිදි නවෝත්පාදන මධ්‍යස්ථාන 12 ක් 2014 වර්ෂයේ සිට ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට බස්නාහිර පළාතේ 09ක් හා නැගෙනහිර පළාතේ 01ක් වශයෙන් පළාත් 02 ක් පමණක් ආවරණය වන ලෙස මධ්‍යස්ථාන ආරම්භ කර තිබුණි.

**4.1.3 පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කාර්යසාධනයට අදාලව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.900,000 ක් වැය කරමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 14 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද පවත්වා තිබුණේ වැඩසටහන් 05 ක් පමණක් වූ අතර ඒ සඳහා රු.801,989 ක් වැයකර තිබූ බව නිරීක්ෂණය විය.

(ii) කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දේශීය පුහුණු වැඩසටහන් 24ක් හා විදේශීය පුහුණු වැඩසටහන් 12ක් සඳහා සහභාගි කර වීමට ක්‍රියාකාරී සැලැස්මට අනුව සැළසුම් කර තිබුණද , දේශීය පුහුණු වැඩසටහන් 17 ක් හා විදේශීය පුහුණු වැඩසටහන් 09ක් සඳහා පමණක් නිලධාරීන් සහභාගි කරවා තිබුණි. මීට අමතරව අධ්‍යක්ෂ ජනරාල් හා අමාත්‍යාංශ නිලධාරීන් 05 දෙනෙකු පිළිවෙලින් විදේශීය සම්මන්ත්‍රණ 03ක් හා 05ක් සඳහා සහභාගි වී තිබුණි. මේ සඳහා රු.2,000,000 ක් වෙන් කර තිබූ අතර වැය කර තිබූ මුදල රු.1,840,128 ක් විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බුද්ධිමය දේපළ කාර්යාලය විසින් අනුමත ගාස්තු අනුව පුද්ගල අනුයෝජිතත්වයක් සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුවට වඩා අනුයෝජිතත්වයක් අලුත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව ඉහළ අගයක් ගෙන තිබූ බැවින් වර්ෂ 03 කට පසු ලියාපදිංචිය අළුත් කිරීම වෙනුවට අළුතෙන් ලියාපදිංචි වීම කෙරෙහි යොමුවීමේ ප්‍රවනතාවයක් පැවතිණි.

(ආ) 2006 අංක 01 දරන බුද්ධිමය දේපළ නියෝගය අනුව 2006 මැයි 17 දින සිට ක්‍රියාත්මක කර තිබූ බුද්ධිමය දේපළ කාර්යාලය විසින් සපයනු ලබන කාර්යයන් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සංශෝධනය කර නොතිබුණි.

(ඇ) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ අනුයෝජිතයින් ලියාපදිංචි කිරීමට අදාල 175 (5) වගන්තිය ප්‍රකාරව වලංගු කාලය ඉකුත් වී මාස 06 ක් ඇතුළත නියම කරනු ලබන අධිභාරයක් ගෙවීම මත ලියාපදිංචිය අළුත් කළ හැකි වුවත් 2006 අංක 01 දරන බුද්ධිමය දේපළ නියෝග 58 හි 10(ii) ප්‍රකාරව ලියාපදිංචි කාලය ඉකුත් වී සති 02 ක් තුල අළුත් කිරීමේ ගාස්තු ගෙවා නැත්නම් ලේඛනයෙන් ඉවත් කළ යුතු බව සඳහන්වේ. මෙම පරස්පරතාවයන් නිවැරදි කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොහැකිවී තිබුණි.

(ඈ) පසුගිය වර්ෂයේදි ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබා ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කර තිබූ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 7.4.1 මාර්ගෝපදේශය අනුව ලංසු වලංගු කාලය තුල ප්‍රසම්පාදනය කටයුතු අවසන් කිරීමට ප්‍රසම්පාදන කමිටුව අපොහොසත් වීම නිසා එම ප්‍රසම්පාදනය නවතා නැවත මිල ගණන් කැඳවීමට තීරණය කර තිබුණි.

(ඉ) ජාත්‍යන්තරව වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ සන්ධාන පත්‍රයට ප්‍රවේශවීම සඳහා බුද්ධිමය දේපළ පනතේ දැනට ක්‍රියාත්මක වන නීති සංශෝධනය කිරීම හා ඒ සමඟ පනතේ සිදු කල යුතු සංශෝධන කටයුතු සිදුකර අවසන් වී නොතිබීම හා කාර්ය මණ්ඩලයේ ජ්‍යෂ්ඨ මට්ටමේ තනතුරු සියයට 50 ක් පුරප්පාඩුව පැවතීම ආයතනයේ ක්‍රියාකාරී සැලසුමට අනුව කටයුතු කිරිම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබූ බව නිරීක්ෂණය විය.

(ඊ) සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් භූමියක බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදිකෙරමින් පැවතියදී ඒ ආශ්‍රිත ඉඩම් සංචාරක කර්මාන්තය ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීම නිසා ඒ සඳහා ආයතනයෙන් වැය කර තිබූ රු. 22,298,751 ක මුදල නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් අයකර ගැනීම සඳහා 2015 මාර්තු 13 දිනැති අංක අමප/15/0272/625/007 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2015 අප්‍රේල් 23 දින අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එකී මුදල අයකරගත නොහැකි වී තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

-----------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම**

------------------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව කාර්යාලය තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණද තම විෂය පථයට අනුව ළඟා කර ගත යුතු තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

---

### 6.1 අභ්‍යන්තර විගණනය

ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකය මගින් සිදු කළද 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(l) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව අරමුදලේ කටයුතු පිළිබඳව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කර නොතිබුණි.

### 6.2 අයවැය පාලනය

අයවැය ගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 04 සිට සියයට 08 දක්වා වූ පරාසයක විචලනයක් සහ අයවැය ගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 6.3 විගණකාධිපතිවරයාගේ වාර්තාව හා වාර්ෂික ගිණුම්

විගණකාධිපතිවරයාගේ වාර්තාව හා වාර්ෂික ගිණුම් සම්බන්ධයෙන් 2006 දෙසැම්බර් 22 දිනැති හා අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර 2014 වර්ෂයේ එම වාර්තාව 2018 අගෝස්තු මාසයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබූ අතර 2015 හා 2016 වර්ෂවලට අදාල වාර්තා විගණන අවස්ථාව වූ 2018 ජූලි 18 දින වන විටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් | නිරීක්ෂණ |
|---|---|

| | |
|---|---|
| (අ) වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම | (i) කාර්යාලයට ලැබෙන අයදුම්පත් පරීක්ෂා කිරීම, ගැසට් කිරීම, ලියාපදිංචි කිරීම හා අළුත් කිරීම යනාදී කාර්යයන් වල සැලකිය යුතු ප්‍රමාදයක් පැවති අතර වර්ෂය අවසාන වන විට ලියාපදිංචි කිරීමට ඇති ගොනු ප්‍රමාණය කොපමණද යන්න ලබා ගැනීමේ ක්‍රමවේදයක් නොපැවතීම.<br>(ii) ලකුණක් ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පතක් ලැබුණ පසු එය ප්‍රතික්ෂේප විම මත සාකච්ඡා වාර පවත්වා තිබූ අතර එම සාකච්ඡා වාර අවසාන වීම සඳහා ද සැලකිය යුතු කාලයක් ගතවී තිබීම.<br>(iii) පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ පසු නැවත ඒ සම්බන්ධයෙන් සිහි කැඳවීම් සිදු කිරීමට අදාල ඉල්ලුම්කරුවන්ට සිදු වී තිබූ අවස්ථා පැවතීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 න් 06 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 66 න් 22 ක් ද පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු කාර්යාලයේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපා තිබීම. |
| (ඇ) ඉන්වෙන්ට්‍රි පාලනය | එකිනෙක අංශයන්හි පවතින වත්කම් වෙනුවෙන් ඉන්වෙන්ට්‍රි ලේඛන නඩත්තු කර නොතිබුණු අතර ගබඩාවේ ඇති ලේඛනයේ පමණක් සියළු වත්කම් ඇතුළත් කර තිබීම |
| (ඈ) අනුයෝජිතයින් ලියාපදිංචි කිරීම | වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් වලට අදාල කටයුතු කාර්යාලයේ ලියාපදිංචි අනුයෝජිතයින් මගින්ද සිදු කෙරෙන අතර වර්ෂ 03 ක කාලයකට ලියාපදිංචි කරන අනුයෝජිතයෙකු ලියාපදිංචිය අළුත් කිරීම සඳහා කෙරෙන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඉල්ලීම කරන ලද දිනයේ සිට ඒ සඳහා මාස 03 සිට මාස 18 දක්වා කාල ප්‍රමාදයක් සිදු වී තිබීම |
| (ඉ) දත්ත පද්ධතිය තුල වාර්තා පවත්වා ගෙන යාම | (i) වර්ෂය ආරම්භ වන විට හා වර්ෂය අවසාන වන විට ලියාපදිංචි කිරීමට ඇති ගොනු සංඛ්‍යාව කොපමණද යන්න ලබාගත නොහැකි වීම.<br>(ii) යම් නිශ්චිත දිනකට පැවති කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් පසු දිනකදී ලබා ගත නොහැකිවීම.<br>(iii) දත්ත, ගොනු අනුව නොව කරන ලද එකිනෙක ක්‍රියාකාරකම් අනුව පැවතීම.<br>(iv) කාර්යසාධනය සම්බන්ධයෙන් මූල්‍ය වාර්තා සමග ඉදිරිපත් කර ඇති තොරතුරු හා විගණනය වෙත තොරතුරු කැඳවීම සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අතර වෙනස්කම් පැවතීම. |
| (ඊ) දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | සැලසුම් කළ පරිදි දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් නොපැවැත්වීම. |
| (උ) ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමේ ප්‍රමාදයක් පැවතීම. |